**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ අරමුදල - 2012**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට වායු විමෝචන පරීක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමේදි පොළී සහිත මිල යටතේ මිලදී ගැණුම් සිදුකර ඇති බව නිරීක්ෂණය වූ අතර, එහිදී ගැණුම්කරුට කාලච්ඡේදය අගදී පොළී ප්‍රකාශ කරන විට එම කාලයට අදාල මුළු පොළිය හිමි වුවද, වර්ෂයට අදාල පොළී ආදායම විය යුත්තේ මිලදී ගත් දින සිට පොළිය ප්‍රකාශයට පත් කරන දින දක්වා පොළියයි. අතිරික්ත පොළිය පෙර ගැණුම්කරුගේ හිමිකමක් වන අතර, එම පොළිය ගෙවූ පිරිවැයෙන් අඩුකල යුතුවේ. එසේ වුවද, ගිණුම්වලට අනුව ලද පොළී ආදායම ලෙස රු.7,574,180 ක් හා ලැබිය යුතු පොළිය ලෙස රු.4,776,058 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, භාණ්ඩාගාර බැඳුම්කර සහතිකපත් අනුව 2012 වර්ෂයට අදාල ලැබුණු හා ලැබිය යුතු මුළු පොළිය රු.5,442,763 කි. ඒ අනුව සාවද්‍ය ගිණුම් තැබීම හේතුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර පොළී ආදායම රු.6,907,475 කින් හා ආයෝජන පිරිවැය සමාන ප්‍රමාණයකින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය මඟින් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොළිය රු.4,736,817 ක් වුවද, එම පොළිය රු.39,241 ක් වැඩියෙන් හා භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මඟින් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොළිය රු.14,807 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.321,156 ක් වූ වියදම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි.

1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) රජයේ මුදල් රෙගුලාසි | |
| (i) 371(2)(ආ) වගන්තිය | මාණ්ඩලික නිලධාරියකුහට තත්කාර්යය අතුරු අග්‍රිමය ලෙස රු.20,000 ක් ලබාදිය හැකි වුවත්, එකී සීමාව ඉක්මවා අවස්ථා 35 වැඩි ප්‍රමාණයක් අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) 372 වගන්තිය | දෙපාර්තමේන්තුවක් හෝ කාර්යාලයක් හෝ භාරයේ තිබෙන අග්‍රිමයන් නැතහොත් අතුරු අග්‍රිමයන් පරීක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ වෙනත් නිලධාරියකු විසින් අවම වශයෙන් මාසයකට එක් වරක් පරීක්ෂණයක් කළ යුතු වුවද, අරමුදලේ අත්තිකාරම් ලේඛනය එවැනි පරීක්ෂණයකට ලක්කර නොතිබුණි. |
| (iii) 395 ( ඇ) | මාසයක් ඉකුත් වී ඊළඟ මස 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(iv) 396 (ඈ)

බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද එහෙත් අදාල මාසය තුලදී මුදල් නොකරන ලද චෙක්පත්වල ලැයිස්තුව සඳහා නිකුත් කල දිනය සඳහන්කර නොතිබුණි.

නිකුත් කල නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ට වැඩි චෙක්පත් 07 ක වටිනාකම රු.100,458 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ
------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන චක්‍රලේඛයේ 3.2(ආ) ඡේදය

ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම හා අතිරික්ත අරමුදල් බාහිර ආයතනයන්හි ආයෝජනය කර ඇති විටෙක ඒවා කල්පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2003 අංක 17 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත මගින් සංශෝධිත රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ 2 (4 ආ) (අ) , (ආ) උප වගන්ති

වායු විමෝචන අරමුදලේ සේවයේ නියුතුව සිටින නිලධාරීන් 18 ක් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.177,236,281 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී අතිරික්තය රු.108,116,340 ක් වූයෙන් අතිරික්තයෙහි වැඩිවීම රු.69,119,941 ක් විය. මෙම වැඩිවීම සඳහා වායු විමෝචන සහතිකපත් ආදායම රු. 34,841,288 කින් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත පොලී ආදායම රු. 27,303,302 කින් වැඩිවීම යන කරුණු බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

2011 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ එක් එක් වාහන පංතීන් අනුව ලියාපදිංචි කර ඇති මුළු වාහන සංඛ්‍යාවෙන් 2012 වර්ෂය තුල වායු විමෝචන සහතික ලබාගත් වාහන සංඛ්‍යාව පිළිබඳව විස්තරයක් පහත දැක්වේ. (මෙරට ලියාපදිංචි කරන ලද අළුත්ම වාහන සඳහා වසරක කාලයක් වායු විමෝචන පරීක්ෂණ සහතික ලබා ගැනීම අවශ්‍ය නොවන බැවින් 2011 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචිය සිදු කරන ලද වාහන සංඛ්‍යාව මෙම විශ්ලේෂණය සඳහා පදනම් කරගෙන ඇත.)

| | **2011 දෙසැම්බර් 31 දිනට පැවති මුළු වාහන සංඛ්‍යාව** | **2012 වර්ෂය තුල වායු විමෝචන සහතික ලබා ගත් වාහන සංඛ්‍යාව** | **පැවති වාහන සංඛ්‍යාවෙන් සහතික ලබා ගත් වාහන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| මෝටර් සයිකල් | 2,354,163 | 1,371,058 | 58 |
| ත්‍රිවීල් | 667,969 | 554,778 | 83 |
| මෝටර් කාර් | 468,168 | 302,750 | 65 |
| ද්විත්ව කාර්ය වාහන | 242,746 | 209,511 | 86 |
| ලොරි රථ | 311,510 | 180,619 | 58 |
| මෝටර් කෝච් / බස් | 88,528 | 39,895 | 45 |
| එකතුව | 4,133,084 | 2,658,611 | |

(අ) ත්‍රීවීල්, ද්විත්ව කාර්ය වාහන හැර අනෙක් වාහන ප්‍රමාණවත් සංඛ්‍යාවක් වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත සඳහන් පරිදි සියළුම වාහනවල වායු විමෝචන සහතික ලබාගැනීමේ පිරිහීමේ තත්ත්වය අනුව ව්‍යාජ ලෙස වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාගන්නා හෝ වායු විමෝචන සහතික ලබා නොගන්නා වාහන තිබේද යන්න හඳුනාගැනීම සඳහා දෙපාර්තමේන්තුව විධිමත් වූ වැඩ පිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

මාර්ග දෙපස රථවාහන දුම් පරීක්ෂණ වැඩසටහන්වලට සහභාගිවීම සඳහා කුලී පදනම මත පෞද්ගලික සමාගමකින් වාහන ලබාගෙන තිබුණු අතර, ඒ සඳහා ගෙවීම් කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉන්වොයිසියේ සඳහන් වේලාවන් සහ අදාල පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබෙන වේලාවන් අතර වෙනස්කම් පැවතීම.

(ආ) ධාවනය කරනු ලබන කිලෝමීටර් ගණන නිවැරදි ලෙස දක්වා නොතිබීම.

(ඇ) එකම සමාගම විසින් කිලෝමීටරයට ගන්නා ගාස්තුව එක් එක් අවස්ථාවේදී වෙනස් වී තිබීම.

(ඈ) අසම්පූර්ණ බිල්පත් සඳහා ගෙවීම් කර තිබීම.

(ඉ) වාහන කුලී ගාස්තු ගෙවීමේදී චෙක්පත් මාර්ගයෙන් ගෙවීම් කිරීම වෙනුවට, වාහනයේ ගමන් කළ නිලධාරීන් විසින්ම මුදලින් ගෙවීමට කටයුතු කර තිබීම.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් සහ පෞද්ගලික මගී ප්‍රවාහන සේවයට අයත් බස් රථ සහ රජයට අයත් වාහන සඳහා වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන නිසි අයුරින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පරිසර දූෂණයට ඉවහල් වන වාහනවලින් පිටවන දුම් පාලනය කිරීමේ පරමාර්ථයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවද, එකී අරමුණු ප්‍රමාණවත් ලෙස ඉටු කරගෙන තිබේද, නැද්ද යන්න සනාථ කර ගැනීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර පැවති තත්ත්වය සහ ක්‍රියාත්මක කිරීමෙන් පසු පැවති තත්ත්වය පිළිබඳව සංසන්දනාත්මක පාරිසරික දත්ත පදනම් කරගෙන ඇගයීමක් විධිමත් පරිදි සිදු කර නොතිබුණි.

(ඇ) මෙම වැඩසටහන ආරම්භ කරන ලද දිනය වන 2008 නොවැම්බර් 17 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා කාලච්ඡේදය තුල වායු විමෝචන පරීක්ෂණ ගාස්තු ලෙස සමාගම් දෙක විසින් අයකරනු ලබන ගාස්තුවෙන් සියයට 10 ක කොටස ලෙස රු.364,046,115 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණද, සමාගම් දෙක විසින් පරීක්ෂා කරන ලද සියළු මෝටර් වාහනවලට අදාලව අය කරන ලද වායු විමෝචන පරීක්ෂණ ගාස්තුවලින් දෙපාර්තමේන්තු කොටස නිවැරදිව එවා තිබේද? නැද්ද යන වග තහවුරු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව තුළ නිශ්චිත වූ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලබන පෞද්ගලික ආයතන දෙක විසින් එකී වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ සාර්ථක, අසාර්ථකභාවයන් ඇගයීම් කිරීම සඳහා විධිමත් වූ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණ ක්‍රියාකාරී සැලැස්මට අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) මහජනතාවගේ දැනුම හා ආකල්ප වර්ධනයට වායු විමෝචන දත්ත පිළිබඳව මුද්‍රිත මාධ්‍ය මඟින් මාස 06 කට වරක් ප්‍රකාශයට පත් කිරීම.

(ii) මහජනතාව දැනුවත් කිරීම සඳහා වාහනවල ඇලවීමට ස්ටිකර් 2 ක් මුද්‍රණය කිරීම.

(iii) විෂ දුම් මඟින් ඇතිවන අහිතකර බලපෑම පිළිබඳව රූපවාහිනී ටෙලිනාට්‍ය හා දැන්වීම් මඟින් හා ගුවන් විදුලි දැන්වීම් මඟින් දිවයිනේ සියළුම ජනතාව දැනුවත් කිරීම.

(iv) ICTA ( Information Communication Technology Agency) ආයතනය මගින් ලැබෙන දත්ත විශ්ලේෂණය කිරීම හා එම දත්ත මහ ලේකම් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාල වෙත සම්ප්‍රේෂණය කිරීමට සෘජු (On Line) තොරතුරු ජාලයක් ඇති කිරීම.

(v) දුම් පරීක්ෂණ මධ්‍යස්ථානවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා දිනකට නිලධාරීන් 10 කට වෘත්තීය පරීක්ෂණ පවත්වා ඔවුන්ට සහතික නිකුත් කිරීම.

(vi) පාවිච්චි කරන ලද සියලු වාහන වර්ගවල මූලික දත්ත ලබාගැනීම සඳහා සමීක්ෂණ 24 ක් සිදුකිරීම.

(vii) උප දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කිරීම හා ඊට අනුරූපව මෝටර් රථ පනත සංශෝධනය කිරීම.

4. අයවැය පාලනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ වියදම් 10 ක් සම්බන්ධයෙන් අයවැය ඇස්තමේන්තුව හා සත්‍ය වියදම් අතර, එකතුව රු.68,465,403 ක විචලතා පැවතුණි. ඒ අනුව අයවැය සකස් කිරීම නිසි අයුරින් සිදුකර නොතිබුණු අතර අයවැය ලේඛණ ඵලදායී කළමනාකරණ උපකරණයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

(ආ) වියදම් වර්ග දෙකක් සඳහා එකතුව රු.275,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය

(ආ) අභ්‍යන්තර පාලනය